සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 44 S I,II

නම: .............................................. | නර්තනය (දේශීය) | කාලය පැය එකයි

සැලකිය යුතුයි :

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (I) (ii) (iii) (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරට අදාළ අංකයට හිමි කවය තුළ (×) ලකුණ යොදන්න.**

01) 11 වෙනි ගොඩ සරඹයෙහි සරඹ නාමය වනුයේ ........................ සරඹය යි.
i) අංගහාර ii) බඹර iii) අර්ධ වක්‍ර. iv) පැනීම්

02) රාජ සභාව තුළ පවත් සැලීමේ කාර්යය ඇසුරින් ........................ නිර්මාණය වී ඇත.
i) චාමර කවි ii) සවරන් කවි iii) පතුරු කවි iv) රබන් කවි

03) " වතේ එපුන් සඳ මෙන් බබළාවී" යන කවිය ගයමින් නර්තනය කරන්නේ ........................ නැටුම් ය.
i) රබන් ii) කුළු iii) කළගෙඩි iv) මෝල්ගස්

04) සොකරි ගැමි නාටකයේ හිසට මුන්ඩාසනයක් බැඳ රඟ දක්වන්නේ, ........................ ගේ චරිතයයි.
i) වෙදරාළ ii) ගුරුහාමි iii) පරයා iv) සොත්තානා

05) කුදාතංගතදොං වට්ටම නර්තනය කරන තාල රූපය ........................ වේ.
i) මාත්‍රා 2 + 2+ 4 ii) මාත්‍රා 2 + 2+ 3 iii) මාත්‍රා 2 + 3 iv) මාත්‍රා 3 + 4

06) "මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ" ගීතය අන්තර්ගත වන්නේ ........................ යේය.
i) බෙරහඬ නාට්‍යය ii) විදුර නාට්‍යය නූර්ති iii) මනමේ නාට්‍යය iv) ශ්‍රී වික්‍රම නාට්‍යය.

07) කාලිංග වනෝද්‍යාන සෙල්ලිපිය ........................ යුගයට අයත් වූවකි.
i) පොළොන්නරු ii) කෝට්ටේ iii) අනුරාධපුර iv) යාපහුව

08) " ගැටබෙරයේ මුහුණතෙහි විෂ්කම්භය ........................ කි.
i) වියත ii) විග්ගුස්ස iii) තුනගුල iv) දෑඟුල

09) මුල්ම ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථය වන " පැරකුම්බා සිරිත" රචනා වූයේ ........................ යුගයේය.
i) පොළොන්නරු ii) අනුරාධපුර iii) කෝට්ටේ iv) මහනුවර

10) " සම" නම් ස්ථායී භාවයෙන් ජනිත වනුයේ ...................... රසය යි.
i) හාස්‍ය ii) වීර iii) කරුණා iv) ශාන්ත

11) " විජය කුවේණි එක්වූ දින රාත්‍රියේ සිරසවත් පුර පැවති උත්සවයකදී නැටුම්, ගීත ගායනා හා තූර්‍ය වාදන භාවිතා වූ බව සඳහන් වන්නේ,
i) චූල වංශයෙහිය. ii) බෝධි වංශයෙහිය. iii) ථූප වංශයෙහි ය. iv) මහා වංශයෙහිය.

12) " දොං දොංජිං ජිං ගජිගත " බෙර පදයට අනුව නර්තනය කරන වන්නමකි.
i) තුරඟා ii) හනුමා iii) සැවුලා iv) සිංහරාජ

13) "ගිරි භණ්ඩ" නම් පූජා උත්සවයේදී රනින් කළ බෙර අටක් වාදනය කිරීමට නියෝග දුන් රජු වන්නේ,
i) භාතිකාභය රජු ii) මහාදැලියාමානා iii) දුටුගැමුණු රජු iv) පරාක්‍රමබාහු රජු

14) විතතාතත භාණ්ඩයකි.
i) දෙවොල් බෙරය ii) තම්මැට්ටම iii) ගැටබෙරය iv) දවුල

15) මීකෙද? මීකේ ආල් තිල්ලර ........................ යන මෙම ප්‍රකාශය සොකරි ගැමි නාටකයේදී භාවිතා කරනු ලබන ලද්දේ
i) පරයා විසිනි. ii) ගුරු හාමි විසිනි. iii) සොත්තානා විසිනි. iv) වෙදරාල විසිනි.

16) කතක් නර්තන සම්ප්‍රදායට අයත් තත් වාද්‍ය භාණ්ඩයකි.
i) පෙනා ii) තබ්ලාව iii) සාරංගි iv) හාර්මෝනියම්

17) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගයකි.
i) මුදුන් තාලය ii) වාහල නැටීම iii) යක්ඇනුම iv) මුවමල දිවීම.

18) නගර නිර්මාණයේදී නාට්‍ය ශාලා 5ක් ඉදිකළ රජු වන්නේ,
i) පරාක්‍රම බාහු ii) භාතිකාභය iii) මහාදැලයා මානා iv) නිශ්ශංක මල්ල

19) සොකරි ගැමි නාටකයේ චරිත නිරූපනයකදී සූප්පුවක් භාවිතා කරනුයේ,
i) වෙදරාල ය. ii) ගුරු හාමි ය. iii) පරායා ය. iv) සොත්තානා ය.

20) භරත නාට්‍යම් හි භාවිත සංගීත සම්ප්‍රදාය හා ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,
i) උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතය හා තබ්ලාව යි.
ii) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය හා චෙන්ඩාව යි.
iii) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය හා මෘදංගය යි.
iv) උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතය හා මෘදංගය යි.

- **අංක 21 සිට 24 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


A


B


C


D

21) A රූපසටහනින් දැක්වෙන්නේ,
i) රොබට් නොක්ස් ය. ii) ස්පිල් බර්ජන් ය.
iii) විමලධර්මසූරිය රජු ය. iv) කිත්සිරිමෙවන් රජුය.

22) කරදිය මුද්‍රා නාට්‍යය නිර්මාණ ශිල්පියා දක්නට ලැබෙන රූපය වන්නේ,
i) A ය. ii) B ය. iii) C ය. iv) D ය.

23) සත්පත්තිනි සහ ග්‍රහ අපලය මුද්‍රා නාට්‍යය නිර්මාණය කරන ලද ශිල්පියා හෝ ශිල්පිණිය දක්නට ලැබෙන්නේ,
i) A රූපසටහනෙහි ය. ii) B රූපසටහනෙහි ය.
iii) C රූපසටහනෙහි ය. iv) D රූපසටහනෙහි ය.

24) කරදිය මුද්‍රා නාටකයෙහි රංගනයෙන් දායකවූවන් දක්නට ලැබෙන වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
i) C හා D ය. ii) C හා A ය. iii) B හා D ය. iv) A හා D ය.

25) අතීතයේ මළබෙර වාදනයේදී භාවිතා කරන ලද වාද්‍ය භාණ්ඩයකි.
i) ගැට බෙරය ii) දෙවොල් බෙරය iii) තම්මැට්ටම iv) පටහ බෙරය

26) කෝලායුධය රංග උපකරණය භාවිතා කරනුයේ,
i) කොහොඹයක් කංකාරියේදී ය. ii) පහන් මඩුවේදී ය. iii) දෙවොල් මඩුවේ දී ය. iv) බලි යාගයේදී ය.

27) හැඩකැල්ල, අත්පොට හතර, රහුකුට්ටම අයත් රංග වස්ත්‍රාභරණ කට්ටලය වන්නේ,
i) වෙස් ඇඳුම් කට්ටලය ii) දෙවොල් ඇඳුම් කට්ටලය
iii) පබළු ඇඳුම් කට්ටලය iv) තෙල්මේ ඇඳුම් කට්ටලය

28) උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන් හි පා සරඹ වලින් පසුව නර්තනය කරනු ලබන සරඹ හඳුන්වන්නේ,
i) අත්සරඹ හා දොඹින පද ලෙස ය. ii) ගොඩ සරඹ හා ඉලංගම් සරඹ ලෙස ය.
iii) මණ්ඩිපද හා දොඹින පද ලෙස ය. iv) ගොඩ සරඹ හා මණ්ඩිපද ලෙස ය.

29) උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ අතට සහ ඉනට පළඳින ආභරණ වන්නේ,
i) කෛකමෙත්ත හා අවුල් හැරය ii) බන්දිවළලු හා පායිම්පත්
iii) බන්දිවළලු හා උරබාහු iv) බන්දි වළලු හා බුබුළු පටිය

30) සිංහරාජ වන්නම නර්තනයේදී වාදනය කරන බෙර පදයකි.
- i) දොදොංත තකුදොං
- ii) දොංජිජිගත
- iii) ගාදං දොං ජිංජිං ගජිගත
- iv) ජිං ගත ගොගො

31) ''පුරවර මැද බැඳ රන් ඔන්චිල්ලා''............ මෙහි දෙවෙනි කවි පදය වන්නේ,
- i) සුරපුර දෙවියනි රැකුමෙ සියල්ලා
- ii) දුරයන තරමට පුදුම නොවෙල්ලා
- iii) වැරසර පිරිමිනි තව පැදපල්ලා
- iv) සිටගෙන දෙදෙනෙකු පොලු පාගල්ලා

32) තක් තකට තක රොං ................ මෙය,
- i) මාත්‍රා 2 + 4 තාලයට අයත් අඩව්වකි.
- ii) මාත්‍රා 3 + 4 තාලයට අයත් අඩව්වකි.
- iii) මාත්‍රා 2 + 3 තාලයට අයත් අඩව්වකි.
- iv) මාත්‍රා 2 + 3 තාලයට අයත් සීරුමාරුවකි.

33) අතීතයේ මහා සෑය බැඳීමේදී වඩුවන් රැස්කරවීමට ද අණබෙර වැයූ බව දැක්වෙන්නේ,
- i) දේවානම්පියතිස්ස රජු කාලයේදී ය.
- ii) දුටුගැමුණු රජු කාලයේ දී ය.
- iii) පණ්ඩුකාභය රජු කාලයේදී ය.
- iv) භාතිකාභය රජු කාලයේදී ය.

34) අංග රචනයේදී කටෙහි දත් නැතිබව දැක්වීම සඳහා දත් වර්ණ ගැන්වීමේදී භාවිතා කළ යුතු සුදුසුම වර්ණය වන්නේ,
- i) රතු ය.
- ii) නිල් ය.
- iii) දුඹුරු ය.
- iv) කලු ය.

35) සිසි සහ චන්ද්‍ර යන චරිත දක්නට ලැබෙන මුද්‍රා නාට්‍යයකි.
- i) කුඹී කතාව
- ii) කරදිය
- iii) නළ දමයන්ති
- iv) සිරිසඟබෝ

36) සොකරි ගැමි නාටකය තුළ වැඩි වශයෙන් භාවිතා කරන බෙර පදයක් වන්නේ,
- i) ජිංගත ගොගො
- ii) දොංත ගතං
- iii) දොංජිජිගත
- iv) තකට දොදොං

37) කුඹී කතාව ප්‍රථමයෙන් නිෂ්පාදනය කළ වර්ෂය වන්නේ,
- i) 2007 ය.
- ii) 2005 ය.
- iii) 2014 ය.
- iv) 2002 ය.

38) නර්තනයේ මූලික මාධ්‍යය වනුයේ,
- i) තාලය යි.
- ii) මැණ්ඩිය යි.
- iii) නාදය යි.
- iv) චලනය යි.

39) උඩරට හා පහතරට ප්‍රධාන ශාන්ති කර්ම පුරාවෘත අනුව චරිත නාම පිළිවෙලින් දැක්වෙන්නේ,
- i) සේරමාන් රජු, විජය රජු, කුවේණිය , ගෝනා
- ii) මළය රජු, ඌරා හා සේරමාන් රජු, ගෝනා
- iii) සක්දෙවි , ගෝනා හා පඬුවස්දෙව් රජු, ඌරා
- iv) සේරමාන් රජු, රාහුඅසුරේන්ද්‍රයා හා විජය රජු, කුවේණි.

40) '' හනික වරෙව් කොල්ලනේ.... ගීතය නිර්මාණය කරන ලද්දේ,
- i) දයානන්ද ගුණවර්ධන මහතා විසිනි.
- ii) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසිනි.
- iii) බන්දුල ජයවර්ධන මහතා විසිනි.
- iv) මහගමසේකර මහතා විසිනි.

* * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 44 S II

නම: ..............................................

**නර්තනය**

**කාලය පැය දෙකයි**

උපදෙස් :
- **I කොටසෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමිවේ.**

01) (i) කොහොඹා කංකාරි ශාන්ති කර්මය ප්‍රථමයෙන් පවත්වන ලද ස්ථානය ............................................ වේ.

(ii) ගායනයෙන් පසුව තාල තැබීම ............................................ වේ.

(iii) බෙර වාදනයේදී ස්වරාක්ෂර බීජාක්ෂර ලෙසද, උපකාරාක්ෂර ............................................ ලෙසද හැඳින්වේ.

(iv) අංග රචනයේදී දහඩිය දැමීමෙන් මුහුණේ දිලිසෙන ස්වභාවය නැතිකරලීම සඳහා ...................... භාවිතා කරයි.

(v) පහතරට සින්දු වන්නම් රචනා වී ඇත්තේ ............................................ දෙවියන් උදෙසා ය.

(vi) අතීතයේදී වරදකරුවෙකු දඬුවම් පමුණුවන ස්ථානය කරා රැගෙන යාමේදී කරන ලද වාදනය ........................ නමින් හැඳින්වේ.

(vii) ත්‍රිවිධ රත්නය හා ..................................................... දෙවියන් ප්‍රධාන කොට පුද පූජා පැවැත්වීමෙන් පසුව ඔන්චිල්ලා සෑදීම සිරිතකි.

(viii) එකැස් බෙරය ............................................ නමින්ද ව්‍යවහාර කෙරේ.

(ix) කුඹී කථාව මුද්‍රා නාට්‍යයේ පිටපත හා රංග රචනය කරන ලද්දේ කවුරුන් විසින්ද?
අ) පිටපත ............................................ ආ) රංග රචනය ............................................

(x) හේවිසි වාදනයේදී භාවිතා කරන විතත හා සුසිර වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
අ) විතත ............................................ ආ) සුසිර ............................................ (ල.12)

02) i) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.4)

ii) " සොබමන් දෙවිවරු සඳෙනෙක් එතනට
බසිමින් චාමර ගත්තේ සුරතට"

යන කවි පද දෙක අදාල තිතට ප්‍රස්තාර කරන්න. (ල.4)

iii) සැවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල.4)

03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

i) චරිතාංග අංග රචනය
ii) රබන් කවි
iii) සොකරි රඟමඩල
iv) අණබෙර වාදනය
v) කරදිය මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකාරකරණය (ල.4×3=12)

04) " දේශීය ශාන්ති කර්ම ගායන, වාදන, නර්තන හා විවිධ චාරිත්‍ර යන අංග වලින් පරිපෝෂිත විචිත්‍රවත් සංස්කෘතිකාංගයකි.

i) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි දෙකක් හා වාදන අවස්ථා දෙකක් නම් කරන්න. (ල.4)


ii) දෙවොල් මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ හේතු දෙකක් අතීත හා වර්තමාන වශයෙන් වෙන්කර දක්වන්න. (ල.4)

iii) ශාන්ති කර්ම සැරසිලි සඳහා පරිසරයෙන් සොයාගන්නා ද්‍රව්‍ය හතරක් නම් කර සැරසිලි පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

05) පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B



C

i) A රූපයේ දැක්වෙන ද්‍රවිඩ නර්තනය නම් කොට ඒ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල.4)

ii) "B " රූපයේ අන්තර්ගත ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් දක්වා එහි එක් චරිතයක් පිළිබඳව විස්තර කරන්න. (ල.4)

iii) "C" රූපයේ කතා තේමාව ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කිරීමේදී ඇඳුම් පැළඳුම් හා වේදිකා පසුතල නිර්මාණය යොදාගෙන ඇති ආකාරය පිළිබඳ විමසීමක යෙදෙන්න. (ල.4)

06) " ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳව විවිධ මූලාශ්‍ර ඔස්සේ තොරතුරු අධ්‍යයනය කළ හැකිය.

i) ගම්පොල යුගයේ ලංකාවට පැමිණි දේශාටන වාර්තාකරුවෙකු නම් කර ඊට අදාල දේශාටන වාර්තාව සඳහන් කරන්න.

ii) පණ්ඩුකාභය රජු සමයේ පැවති නර්තන කලාවෙහි පසුබිම නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල.4)

iii) " බෞද්ධාගමෙහි සහසම්බන්ධතාවය හේතුවෙන් නර්තන කලාව පෝෂණය වී ඇති ආකාරය මහා වංශයෙහි ඇතුළත් සාධක දෙකක් ඇසුරින් විමසන්න. (ල.4)

07) " නර්තනය මානසික ස්වස්ථතාව කෙරෙහි ඉවහල් වේ."

i) මානසික ස්වස්ථතාව යනු කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) නිරෝගී දිවියකට නර්තනයෙන් ලැබෙන සහය කෙබඳුදැයි විස්තර කරන්න. (ල.4)

iii) ගීත අනුව නර්තන නිර්මාණ කිරීමේදී රසවින්දනය වර්ධනය වන ආකරය උදාහරණ සහිතව විමසන්න. (ල.4)

* * * *